සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# යුරෝපා ඉතිහාසය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි.
- ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි වරහන් තුළ වූ තිත් ඉර මත ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු එම කොටස II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 05 තෙක් වූ ප්‍රශ්න වලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිර ඉර මත ලියන්න.

(01) (1) බුර්බන් (2) ඔරෙන්ජ් (3) හැජස්බර්ග්
(4) ස්ටුවර්ට් (5) කයිසර් (......)

(02) (1) සේන් (2) තේම්ස් (3) පො
(4) විස්චියුලා (5) ඉන්දු (......)

(03) (1) බොහිමියන් අවධිය (2) ඩෙන්මාර්ක් අවධිය (3) ඉතාලි අවධිය
(4) ප්‍රංශ අවධිය (5) ස්වීඩන් අවධිය (......)

(04) (1) ක්‍රිස්තු වර්ෂ 1215 මහා අධිකාරි පත්‍රය (2) රෙපරමාදු පාර්ලිමේන්තුව
(3) ක්‍රි. ව. 1628 අයිතිවාසිකම් පෙත්සම (4) දීර්ඝ කාලීන පාර්ලිමේන්තුව
(5) පව් සමා කිරීමේ පත්‍රය (......)

(05) (1) ආදි යාතික් මුහුද (2) රතු මුහුද (3) ඊජියන් මුහුද
(4) කළු මුහුද (5) කැස්සියන් මුහුද (......)

- පහත දක්වෙන පිළිතුරු යුගලයන් අතරින් එකිනෙකට නොගැලපෙන පිළිතුරු යුගලය හඳුනාගෙන අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

(06) (1) මධ්‍යධරණී මුහුද හා රතු මුහුද සුවස් ඇළ.
(2) කළු මුහුද හා කැස්පියන් මහුද ඩාබනල්ස් සමුද්‍ර සන්ධිය.
(3) එංගලන්තය හා ප්‍රංශය ඉංග්‍රීසි ඕඩය.
(4) උතුරු මුහුද හා බෝල්ටික් මුහුද කීල් ඇල.
(5) ස්පාඤ්ඤය හා මොරොක්කෝව පිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය. (......)

(07) (1) උත්කෘෂ්ට විප්ලවය ක්‍රි. ව 1688
(2) ඔග්ස්බර්ග් සම්මේලනය ක්‍රි. ව. 1555
(3) මහා අධිකාරි පත්‍රය ක්‍රි. ව. 1515
(4) වෙස්ට්සේලියා ගිවිසුම ක්‍රි. ව. 1648
(5) අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම ක්‍රි. ව. 1628 (......)

(08) (1) නාවික හෙන්රි නව ලෝකය සොයා ගැනීම.
(2) බර්තොලමියුඩයස් අප්‍රිකානු මහද්වීපයේ තුඩුවට යාත්‍රා කිරීම.
(3) ක්‍රිස්ටෝපර් කොලම්බස් බටහිර ඉන්දීය දූපත්වලට යාත්‍රා කිරීම
(4) වස්කෝද ගාමා ඉන්දියාවට යාත්‍රා කිරීම
(5) ෆර්ඩිනන්ඩ් මැගලන් ලොව වටා යාත්‍රා කිරීම. (......)

(09) (1) ඩැනියුබ් ගඟ (2) බෝල්ටික් මුහුද (3) බහාමා දූපත්
(4) වාවනල්සි කඳුවැටි (5) සූවස් ඇල (......)

(10) (1) එංගලන්තය ටියුඩර් (2) ස්පාඤ්ඤය සාර් (3) ප්‍රංශය බූර්බන්
(4) ජර්මනි හැප්ක්බර්ග් (5) ඕලන්දය ඔරේන්ජ් (......)

- **අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්නවල මාතෘකාවට නොගැලපෙන එක් කරුණක් වේ. එය තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

(11) ජාතික රාජ්‍ය
(1) බල සංකේන්ද්‍රණය (2) වංශවතුන්ගේ බලය වර්ධනය
(3) ස්ථිර යුධ හමුදාව (4) වෙළඳාම පුළුල්වීම.
(5) වාණිජ වාදය (......)

(12) තිස් අවුරුදු යුද්ධය.
(1) ආගමික විරුද්ධවාදී කම්. (2) ඔක්ස්බර්ග් සමථයේ අඩුපාඩු කම්
(3) 5 වන චාල්ස් රජු සහභාගී වීම. (4) ප්‍රංශයේ ජයග්‍රහණ.
(5) ශුද්ධ රෝම අධිරාජ්‍යයාගේ පරාජය. (......)

(13) එංගලන්ත පාර්ලිමේන්තුවේ වර්ධනය.
(1) ක්‍රි. ව. 1215 මහා අධිකාරී පත්‍රය අත්සන් කිරීම.
(2) ක්‍රි. ව. 1628 1 වන චාල්ස් රජු අයිතිවාසිකම් පනත පිළිගැනීම.
(3) ක්‍රි. ව. 1689 අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය.
(4) ක්‍රි. ව. 1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශනය.
(5) ක්‍රි. ව. 1658 ඔලිවර් ක්‍රොම්බල් මරා දැමීම. (......)

(14) පුනරුදය
(1) මිලානයේ ස්ෆෝසා
(2) ප්ලොරන්ස් මෙඩිසි
(3) පුරා එස්ට්
(4) මාන්ටුවා ගොන්සාගා
(5) එංගලන්තය ටියුඩර් (......)

(15) වැඩවසම් ක්‍රමය
(1) කුරුස යුද්ධය
(2) වෙළඳාමේ දියුණුව
(3) මධ්‍යම පන්තියේ වර්ධනය
(4) ජාතික රාජ්‍ය බිහිවීම
(5) පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය (......)

- **අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට පහත ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ කිහිපයක් නිවැරදි වේ. එම ප්‍රතිචාර අතුරෙන්,**

  (A) සහ (B) පමණක් නිවැරදි නම් ...................... 1 ද,
  (B) සහ (C) පමණක් නිවැරදි නම් ...................... 2 ද,
  (C) සහ (D) පමණක් නිවැරදි නම් ...................... 3 ද,
  (D) සහ (E) පමණක් නිවැරදි නම් ...................... 4 ද
  **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවරදි නම් 5 ද වරහන තුළ යොදන්න.**

((16) වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ මොනවාද ?
(A) බල විකේන්ද්‍රණය (B) ප්‍රවේණි ක්‍රමය
(C) තරගකාරීත්වය (D) මධ්‍යම පන්තියේ බලය අඩුවීම
(E) භාණ්ඩ හුවමාරු ක්‍රමය (......)

(17) රෝම ශිෂ්ඨාචාරයේ පාලකයෝ
(A) බෲටස් (B) මාර්ක් ඇන්ටනි
(C) ඔගස්ටස් (D) ලෙපිඩුස්
(E) ජෝන් බැප්ටිස්
(......)

(18) අරාබි සාහිත්‍ය කෘති අතරට ගැනෙන්නේ,
(A) අල් කුරාණය (B) මුබෝද්දිමා
(C) මයින්කාමින් (D) බයිබලය
(E) ලොම්බාර්ඩි (......)

(19) පුනුරුදය පැතිරීමට තුඩු දුන් සාධක
(A) සම්භාව්‍ය රෝම ශිෂ්ඨාචාරයේ බලපෑම ඉතාලිය තුළ නොනැසී පැවතීම.
(B) කොන්ස්තන්තිනෝපලයේ සිට ඉතාලියට ග්‍රීක රෝම දැනුම ගලා ඒම.
(C) ඉතාලියේ ආර්ථික සංවර්ධනය
(D) ආගමික ප්‍රතිසංස්කරණයේ බලපෑම.
(E) ඉතාලියේ පැවති භේද බින්න බව. (......)

(20) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට තුඩුදුන් සාධක.
(A) ආගමික ප්‍රතිසංස්කරණ ජර්මනියේ ආරම්භ වීම.
(B) එහි නායකයා මාටින් ලූතර්ය.
(C) පුන්‍ය පල පත්‍රිකා විකිණීම ආසන්නතම හේතුවයි.
(D) ස්විට්සර්ලන්තයේ ව්‍යාපාරයේ නායකයා ජෝන් කැල්වින්ය.
(E) පාප් වහන්සේ මෙම ව්‍යාපාරයට අනුග්‍රහ දැක්වූයේය.
(......)

- **අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්න වලට X හා Y තීරු අනුපිළිවෙලින් සකස් කළ විට ලැබෙන සංකේත පිලිවෙලින් සඳහන් පිළිතුරට අදාළ අංකය තිත් ඉරි මත ලියන්න.**

(21)

| | X | | Y |
|---|---|---|---|
| (i) | රුමේනියාව | A | බර්ලින් |
| (ii) | ජර්මනිය | B | වියානා |
| (iii) | ඔස්ට්‍රියාව | C | බෙල්ග්‍රේඩ් |
| (iv) | යුගොස්ලෝවියාව | D | බුකරෙස්ට් |
| (v) | ස්පාඤ්ඤය | E | මැඩ්රිඩ් |

(22) (i) වීනස්ගේ උපත — A ඩෙනටෙල්
(ii) අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය — B මයිකල් ආන්ජිලෝ
(iii) දෙවන ජූලියස් පාප් වහන්සේ — C ලියනාඩෝ ඩාවින්චි
(iv) ඩේවිඩ් — D බොටිචෙල්ලි
(v) විටා — E රෆායල්

(1) DECBA (2) DCEAB (3) DABCE (4) DEBAC (5) DEBCA (......)

(23) (i) වැඩවසම් ක්‍රමය — A යුරෝපීයයන් සතු අධිරාජ්‍ය කැඩී යාම
(ii) දේශගවේෂණය — B මිනිස් අයිතිවාසිකම්
(iii) කාර්මික විප්ලවය — C ධනවාදයේ නැගීම
(iv) ප්‍රංශ විප්ලවය — D ස්වයංපෝෂිත බව
(v) දෙවන ලෝක යුද්ධය — E අධිරාජ්‍ය ගොඩනැංවීම

(1) DECBA (2) DCEAB (3) DABCE (4) DBAEC (5) DEBAC (......)

(24) (i) ප්‍රංශය — A හෙන්ඩ්‍රි හඩ්සන්
(ii) ඕලන්දය — B කොටේස්
(iii) පෘතුගාලය — C සෙබෙස්තියන් තැබෝ
(iv) ස්පාඤ්ඤය — D බර්තලමියු දියස්
(v) එංගලන්තය — E මාක්විටේ

(1) EABDC (2) EACDB (3) EADBC (4) EBDAC (5) EBADC (......)

(25) (i) පීරමිස් — A සමුද්‍ර සන්ධිය
(ii) බොස්පතිස් — B වරාය
(iii) ඩන්කර්ක් — C ගඟ
(iv) සූවස් — D ඇල
(v) රයින් — E කඳුවැටිය

(1) EABDC (2) EACDB (3) EADBC (4) EBDAC (5) EBADC (......)

- **අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රතිචාර ඇසුරෙන් පහත උපදෙස් සම්පිණ්ඩනයට අනුව නිවැරදි ප්‍රතිචාර කවරේදැයි නිගමනය කරන්න.**

(A) සහ (B) පමණක් නිවැරදි නම් ...................... 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ...................... 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ...................... 3 ද,
(D) සහ (E) පමණක් නිවැරදි නම් ...................... 4 ද,
**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් 5 ද වරහන් තුළ ලියන්න.**

(26) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල මොනවාද ?
(A) ගෘහාස්ථික කර්මාන්ත දියුණු වීම
(B) විශාල කර්මාන්ත ශාලා බිහිවීම
(C) පරිසර දූෂණය
(D) වෙළඳාම දියුණු වීම
(E) ආගමික පුනරුදය (......)

(27) තිස් අවුරුදු යුද්ධයට තුඩු දුන් හේතු මොනවාද ?
(A) ක්‍රි. ව. 1555 ඔග්ස්බර්ග් සමථයේ අඩුපාඩු කම්
(B) බොහිමියාවේ කැල්වින්වාදීන් හැප්ස්බර්ග් පාලකයාට විරුද්ධව කැරලි ගැසීම
(C) මාටින් ලූතර්ගේ නායකත්වය
(D) පුණ්‍ය ඵල පත්‍රිකා විකිණීම
(E) එංගලන්තයේ හා ප්‍රංශයේ පාලකයන් අතර වූ මතභේද (......)

(28) මධ්‍යකාලීන යුරෝපයේ වූ වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද ?

(A) කෘෂිකර්මය මත පදනම් වූ ස්වයංපෝෂිත ආර්ථිකයක් තිබීම

(B) ජාතික රාජ්‍ය වල වර්ධනය

(C) නාගරීකරණය

(D) විකේන්ද්‍රගත පාලනය

(E) සමාජ අසමානත්වය (......)

(29) යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට තුඩුදුන් හේතු සාධක කවරේද ?

(A) ස්පාඤ්ඤය හා ප්‍රංශය අතර ඇති වූ යුද්ධය

(B) පල්ලියේ දූෂණය

(C) මාටින් ලූතර්ගේ ක්‍රියාකලාපය

(D) පාප්වහන්සේට විරුද්ධව එංගලන්තයේ ජනතාව කැරලි ගැසීම

(E) 5 වන චාල්ස් පල්ලියෙන් නෙරපා හැරීම (......)

(30) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ කවරේද ?

(A) බලය සංකේන්ද්‍රගත වීම

(B) ස්ථිර යුද්ධ හමුදාව

(C) ස්වයං පෝෂිත ආර්ථිකය

(D) වරප්‍රසාද ලත් ප්‍රභූ පන්තිය

(E) අසහාය රාජ්‍යත්වය (......)

The National e-learning Portal for The General Education

- **පහත මාතෘකා වලට සපයා ඇති කරුණු අතරින් එකක් නොගැලපේ. නොගැලපෙන කරුණේ අංකය තිත් ඉර මත ලියන්න.**

(31) යුරෝපයේ පුනුරුදය.

(1) ඉතාලියේ ආරම්භ විය

(2) ස්වාධීනත්වය ප්‍රධාන ලක්ෂණ වලින් එකකි

(3) ගැරිබෝල්ඩි සාහිත්‍ය කටයුතුවලට අනුග්‍රහය දැක්වීම

(4) ප්‍රධාන පෙළේ චිත්‍ර ශිල්පීන් අතර රෆායල් විය

(5) ප්‍රතිමා ශිල්පීන් අතර ඩොනටෙලෝ ප්‍රධාන විය (......)

(32) එංගලන්තයේ පාර්ලිමේන්තුවේ වර්ධනය

(1) 1215 මහා අධිකාරි පත්‍රය

(2) 1680 එංගලන්ත බැංකුව ආරම්භය

(3) 13 වන හෙන්රි විසින් ඇති කළ ප්‍රතිසංස්කරණය

(4) 1689 අයිතිවාසිකම් පිළිබඳ පනත

(5) 1832 ප්‍රතිසංස්කරණ පණත (......)

(33) ප්‍රංශ විප්ලවය

(1) ස්ටේටස් ජෙනරල් සභාව කැඳවීම

(2) බැස්ටීලය බිඳවැටීම

(3) 10 වැනි ලුවී රජුගේ හිස ගසා දැමීම

(4) 18 වන ලුවී රජ වීම

(5) බීම සමය (......)

(34) ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය
- (1) ජෙසුයිට් නිකාය
- (2) ට්‍රෙන්ට් සම්මේලනය
- (3) ධර්මාධිකරණය
- (4) නිශ්ශබ්ද විලියම් ඝාතනය
- (5) මිෂනාරි ව්‍යාපාරය ආරම්භය (......)

(35) එංගලන්තයේ කාර්මික විප්ලවයට තුඩු දුන් හේතු
- (1) අවශ්‍ය ප්‍රාග්ධනය තිබීම
- (2) අවශ්‍ය ස්වාභාවික සම්පත් තිබීම
- (3) අවශ්‍ය ශ්‍රමය තිබීම
- (4) අවශ්‍ය වෙළඳපොල තිබීම
- (5) අවශ්‍ය ශක්තිමත් හමුදාවක් තිබීම (......)

- **අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන ඒවායෙන් කවර විග්‍රහයදැයි තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|
| (36) පුනුරුදය මෙන්ම ආගමික ප්‍රතිසංස්කරණය මධ්‍යතන යුගයේ බිඳීයාම සළකුණු කළේය. | පුනුරුදය මධ්‍ය කාලීන කලා හා සාහිත්‍ය සම්ප්‍රදායන්ගෙන් බැහැර වූ අතර ආගමික ප්‍රතිසංස්කරණයන් මධ්‍යතන යුගයේ තිබූ එක්සත් කම අවසන් කළේය. | (......) |
| (37) උත්කෘෂ්ට විප්ලවයට තුඩු දුන් ප්‍රධාන හේතුව වූයේ කාර්මික විප්ලවයයි. | උත්කෘෂ්ට විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය වූයේ ''නියෝජනය නැත්නම් බදුත් නැත'' යන්නයි | (......) |
| (38) ප්‍රංශ විප්ලවය ආරම්භ වීමට ප්‍රධාන හේතුව ආදි තන්ත්‍රයේ දුර්වලතාය. | ප්‍රංශ විප්ලව සමය තුළ 16 ලුවී රජුට විරුද්ධව කැරලි ඇති විය. | (......) |
| (39) මාටින් ලූතර් එංගලන්තයේ රෙපරමාදු ව්‍යාපාරයේ පියාය. | ක්‍රි. ව. 1498 දී වස්කෝද ගාමා බහමා දූපතට ගොඩබැස්සේය. | (......) |
| (40) පුනරුදය ඉතාලියෙන් ආරම්භ විය. | මකියාවේලි කලා හා සාහිත්‍ය කටයුතු වලට අනුග්‍රහය දැක්වීම. | (......) |

The National e-learning portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## යුරෝපා ඉතිහාසය - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 03 කටත් පිළිතුරු සපයන්න.**
**(ප්‍රශ්න අංක 01 ට පිළිතුරු සැපයීම සඳහා සිතියමක් සපයා ඇත.)**

---

(01) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම්කරන්න. කැමැති දෙකක් පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.

(1) ඉංග්‍රිසි ඕඩය
(2) රයින් ගඟ
(3) ජිනෝවා
(4) සිසිලි දූපත
(5) නෝර්වේ
(6) ශාන්ත පීටර්ස් බර්ග්
(7) ආදියාතික් මුහුද
(8) බර්ලින්

(නිවැරදිව ලකුණු කිරීමට ලකුණු 01 බැගින්ද, කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගින්ද වේ.)

(02) රෝම ශිෂ්ඨාචාරය යටතේ පහත අංශ වලින් දෙකක් වර්ධනය වූ අයුරු විමසන්න.

(1) දේශපාලන ක්‍රමය
(2) කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
(3) දර්ශණය
(4) විද්‍යාව හා තාක්ෂණවේදය (ලකුණු 7X2)

(03) පුනරුදය වූ කලී යුරෝපා ඉතිහාසයේ නූතන යුගය උදා කළ ප්‍රධාන සිද්ධියකි.

(1) පුනුරුදය මුලින්ම ආරම්භ වූ රට නම් කරන්න. (ලකුණු 02)
(2) පුනුරුදය යනු කුමක්දැයි සැකෙවින් අර්ථ දක්වන්න. (ලකුණු 06)
(3) භාෂාව, කලාව, සාහිත්‍ය යන ක්ෂේත්‍රවල පුනුරුදය නිසා ඇති වූ ප්‍රබෝධය සමාලෝචනය කරන්න. (ලකුණු 06)

(04) (1) කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ වීමට තුඩු දුන් සාධක කවරේද? (ලකුණු 02)
(2) පේෂ කර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය හා යකඩ කර්මාන්තය යන ක්ෂේත්‍රවල ඇති වූ නව නිපැයුම් සැකෙවින් දක්වන්න (ලකුණු 04)
(3) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ සමාජ ආර්ථික ප්‍රතිඵල විමසන්න. (ලකුණු 08)

(05) මධ්‍යම පන්තිය හා ගොවි පන්තිය මුහුණ දුන් ගැටළු ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩු දුන් ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 14)

# යුරෝපා සිතියම

